# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2384/21 – 2024 මැයි මස 14 වැනි අඟහරුවාදා – 2024.05.14**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

වාවස්ථාපිත නිශ්චය අංකය : 4654
විශේෂ අංකය : ර/227

**1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 19 වැනි වගන්තිය යටතේ ව්‍යවස්ථාපිත නිශ්චය**

ඕමල්පේ, දියපොට "ලීලා නිවස" හි පදිංචි දියෝනිස් අප්පුහාමි රාජපක්ෂ දිසානායක මහතා විසින් පනතේ 18 වැනි වගන්තිය යටතේ ව්‍යවස්ථාපිත ප්‍රකාශනයක් කරන ලද අතර මේ වන විට ඔහු මියගොස් ඇති බැවින්, පනතේ 19 වැනි වගන්තිය යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලතල අනුව මෙම කොමිෂන් සභාව විසින් ව්‍යවස්ථාපිත බදු ගැණුම්කරුට අයිතිව තිබූ කෘෂිකාර්මික ඉඩම් වලින් ඔහුට තබා ගැනීමට ඉඩ දිය යුතු කොටස් නිශ්චය කරමින් ඔහුගේ බූදලයට ව්‍යවස්ථාපිත නිශ්චයක් කරන ලදී. එසේ ව්‍යවස්ථාපිත බදු ගැණුම්කරුට තබා ගැනීමට ඉඩදෙන ලද කෘෂිකාර්මික ඉඩම් වලින් කොටසක් මෙහි පහත උපලේඛනයෙහි දක්වේ.

**නීතිඥ පණ්ඩුකාභය හර්ෂ කීර්තිනන්ද,**
සභාපති,
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව.

2024 මැයි මස 10 වැනි දින
අංක 475,
කඩුවෙල පාර,
බත්තරමුල්ල,




*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

උපලේඛනය

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දියපොටගම් පත්තුව සුළු කොට්ඨාසයේ, ඇඹිලිපිටිය - උඩගම (අගපි 778) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් අඳින ලද අනුරේඛන අංක R/LRC/2013/732(LS) හි දැක්වෙන රොඩගලේ යාය, ඇලගොඩ හේන, හිඟුරාරහේනෙ යාය නැමැති ඉඩමේ කැබලි අංක A මගින් නිරූපිත බිම් කොටසේ අක්. 42 රූඩ්. 2 පර්. 37.68ක ප්‍රමාණය සහ එහි තුළ පිහිටි ගහකොළ පලතුරු හා ගොඩනැගිලි ද වේ.

EOG 05-0112

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.